**ශීර්ෂය 248 - සුරාබදු දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2016 වර්ෂය**

---

ශීර්ෂ 248 - සුරාබදු දෙපාර්තමේන්තුවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම, ආදායම් ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2017 ජූලි 27 දින දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

---

විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

---

**2.1 විසර්ජන ගිණුම**

---

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

---

දෙපාර්තමේන්තුව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු. මිලියන 1,072.45 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු. මිලියන 983.98 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු. මිලියන 88.47 ක් හෙවත් සියයට 8.25 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| **වියදම** | **2016 දෙසැම්බර් 31දිනට** | | | **ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|---|
| | **ශුද්ධ ප්‍රතිපාදනය** | **උපයෝජනය** | **ඉතිරිය** | |
| | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | |
| පුනරාවර්තන | 745.67 | 743.10 | 2.57 | 0.34 |
| මූලධන | 326.78 | 240.88 | 85.90 | 26.29 |
| එකතුව | 1,072.45 | 983.98 | 88.47 | 8.25 |

## 2.2 ආදායම් ගිණුම්

**ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම්**

දෙපාර්තමේන්තුව විසින් 2016 වර්ෂය සඳහා ආදායම් සංකේත 02 ක් සඳහා එකතුව රු.මිලියන 125,035 ක ආදායම් ඇස්තමේන්තු කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී එකතුව රු.මිලියන 120,277.89 ක ආදායමක් රැස්කර තිබුණි. එය ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 96.19 ක් වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| ආදායම් සංකේතය | 2016 දෙසැම්බර් 31 දිනට ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය ආදායම | ඉක්මවීම/ (ඌනතාවය) | ඉක්මවීම / (ඌනතාවය) ඇස්තමේන්තුවේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| 10.02.04.01 | 125,000 | 120,238.07 | (4761.93) | (3.81) |
| 10.02.06.00 | 35 | 39.82 | 4.82 | 13.77 |
| | 125,035 | 120,277.89 | (4757.11) | |

## 2.3 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දෙපාර්තමේන්තුවට අදාල විෂය අංක 24801 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ .

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 38.00 | 37.98 | 30.00 | 31.47 | 171.00 | 129.94 |

## 2.4 අග්‍රිම ගිණුම

දෙපාර්තමේන්තුවේ 2016 දෙසැම්බර් 31 දිනට අංක 7002/0000/00/0072/0016/000 අග්‍රිම ගිණුමේ ශේෂය රු.මිලියන 228 ක් විය.

## 2.5 පොදු තැන්පත් ගිණුම

දෙපාර්තමේන්තුව යටතේ වන පොදු තැන්පත් ගිණුම් 04 ක 2016 දෙසැම්බර් 31 දිනට ශේෂ එකතුව රු.මිලියන 88 ක් විය. විස්තර පහත දැක්වේ.

| තැන්පත් ගිණුම් අංකය | 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|
| | රු.මිලියන |
| 6000/0000/00/0001/0122/000 | 54.0 |
| 6000/0000/00/0002/0178/000 | 4.0 |
| 6000/0000/00/0016/0126/000 | 17.0 |
| 6000/0000/00/0018/0119/000 | 13.0 |
| එකතුව | 88.0 |

## 2.6 විගණන නිරීක්ෂණය

සුරාබදු දෙපාර්තමේන්තුවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති පරිදි කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

### 3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛනයක් පවත්වා නොතිබුණු අතර, ලේඛන 2 ක් යාවත්කලීනව පවත්වා නොතිබුණු බැව් නියැදි පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය | නිරීක්ෂණය |
|---|---|---|
| හානි පිළිබඳ ලේඛණයක් | මුදල් රෙගුලාසි110 | යාවත්කාලින කර නොතිබුණි. |
| වාහන ලොග් පොත් | මුදල් රෙගුලාසි1645 (අ) | වාහන 28ක් සඳහා ලොග් පොත් පවත්වා නොතිබුණි. |
| ස්ථාවර වත්කම් ලේඛණය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | යාවත්කාලින කර නොතිබුණි. |

### 3.2 විගණන සාක්ෂි නොවීම

ආපදා ණය ලිපිගොනු 6 ක් විගණනයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන් එකතුව රු. 322,849 ක් වූ ආපදා ණය ශේෂයක් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කළ නොහැකි විය.

### 3.3 විගණන විමසුම්වලට පිළිතුරු දීම

දෙපාර්තමේන්තුව වෙත සමාලෝචිත වර්ෂයේදී ඉදිරිපත් කරන ලද විගණන විමසුමකට 2017 ජුලි 10 දින වන විටත් පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. එම විමසුමට අදාළ ගණනය කළ හැකි ගනුදෙනුවල වටිනාකම රු. 140,099 ක් වී තිබුණි.

### 3.4 විසර්ජන ගිණුම

**අයවැය විචලනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව සම්පූර්ණයෙන් හා නිවැරදිව ඇස්තමේන්තු පිළියෙල නොකිරීම නිසා වැය විෂයයන් 10 ක් සඳහා පරිපූරක ඇස්තමේන්තු මගින් රු. 82,787,553 ක අතිරේක ප්‍රතිපාදන ලබාගෙන තිබුණු අතර එය එම වැය විෂයයන්වල ඇස්තමේන්තු ප්‍රතිපාදනයෙන් සියයට 11 සිට සියයට 200 දක්වා වූ පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි..

(ආ) වැය විෂයන් 05 ක් සඳහා පරිපූරක ඇස්තමේන්තු මගින් රු. 38,420,000 ක් ද මුදල් රෙගුලාසි 66 මගින් රු. 28,677,919 ක්ද වශයෙන් එකතුව රු. 67,097,916 ක අමතර ප්‍රතිපාදන සලසාගෙන තිබූ අතර, එය එම වැය විෂයයන්ගේ මූලික ඇස්තමේන්තු ප්‍රතිපාදනයෙන් සියයට 21 ක් විය.

(ඇ) වැය විෂය අංක 2502 සඳහා මූලික ඇස්තමේන්තු මගින් ප්‍රතිපාද සලසා නොගෙන පරිපූරක ඇස්තමේන්තු මගින් රු.18,600,000 ක ප්‍රතිපාදන සලසා ගෙන තිබුණද, ඉන් සියයට 99ක් ලෙස රු.18,470,197 ක ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි. තවද ගොඩනැගිල්ලක ඉදිකිරීම් කටයුතු අසාමාන්‍ය ලෙස ප්‍රමාද වීම නිසා ගොඩනැගිලි සහ ඉදිකිරීම් යටතේ සලසා තිබුණු ප්‍රතිපාදනවලින් සියයට 24 ක් හෙවත් රු.64,649,613 ක මුදලක් ඉතිරි වී පැවතුණි.

### 3.5 අග්‍රිම ගිණුම

2016 දෙසැම්බර් මස අග්‍රිම නිදහස් කිරීම්වලට අදාල මාසික සාරාංශ අනුව රු.73,000,000 ක් වූ අග්‍රිම ශේෂයන් ඊට අදාල සැසඳීම් වාර්තාවල රු. 90,547,553 ක් ලෙස දක්වා තිබුණි.

### 3.6 පොදු තැන්පත් ගිණුම

වර්ෂ 2 සිට වර්ෂ 5 දක්වා අතර කාලයක් ඉක්මවූ එකතුව රු. 485,000 ක් වූ තැන්පතු 19 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

### 3.7 ආදායම් ගිණුම්

ආදායම් ගණන්දීමේ නිලධාරියා වශයෙන් ආදායම් සංකේත 02 ක ආදායම් ඇස්තමේන්තු පිළියෙල කිරීම, ආදායම් රැස්කිරීම, ගිණුම්ගත කිරීම හා ගිණුම් ඉදිරිපත් කිරීමේ කාර්යභාරයන් දෙපාර්තමේන්තු ප්‍රධානියාට පැවරී තිබුණි. එම ආදායම් සංකේතවලට අදාළව සිදු කළ නියැදි විගණනයේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) අංක **10.02.04.01** දරන ආදායම් සංකේතය - සුරාබද්ද (මත්පැන්)

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) විගණනයට ඉදිරිපත් කළ ආදායම් ගිණුම අනුව එකතුව රු. මිලියන 2,544.81 ක ආදායම් හිඟහිට තිබුණු අතර, එම හිඟ හිටි ආදායම වර්ෂ 1 සිට වර්ෂ 5 ක් අතර කාල පරාසයකට අයිති විය.

(ii) මත්පැන් අපනයනයේදී, අපනයන බදු ප්‍රතිදාන ලබා දීම සඳහා දෙපාර්තමේන්තුව විසින් පදනම් කරගනු ලබන්නේ අපනයනකරු විසින් ඉදිරිපත් කරනු ලබන රේගු අපනයන සටහන්කරය පමණක් විය. එහෙත් සත්‍ය වශයෙන්ම අපනයනය කරන ලද ප්‍රමාණය තීරණය කිරීම සඳහා විධිමත් ක්‍රමවේදයක් දෙපාර්තමේන්තුව විසින් හඳුන්වා දී නොතිබුණි.

(iii) ලයන් බීර සමාගම විසින් ධාන්‍ය මත්පැන් නිෂ්පාදනය සඳහා භාවිතා කරන අමුද්‍රව්‍ය වර්ග හා ඒවායේ ප්‍රමාණයන් පිළිබඳව සොයා බැලීම සඳහා ක්‍රමවේදයක් සුරාබදු දෙපාර්තමේන්තුව සතුව නොපැවතුණි.

(iv) ධාන්‍ය මත්පැන්වල ශරීරයට අහිතකර ද්‍රව්‍යන් අඩංගුව පවතීද යන්න සහ ඒවායේ අඩංගු සීනි ප්‍රතිශතය කොපමණද යන්න පිළිබඳ විශ්ලේෂණාත්මක වාර්තාවක් රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවෙන් ලබාගෙන නොතිබුණි.

(ආ) අංක **10.02.06.00** දරන අදායම් සංකේතය - දුම්කොළ බද්ද

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ඉකුත් වර්ෂයේ තථ්‍ය ආදායමට වඩා සමාලෝචිත වර්ෂයේ තථ්‍ය ආදායම රු. මිලියන 05 කින් වැඩි වී තිබුණි.

(ii) දෙපාර්තමේන්තුව විසින් සිගරට් අපනයනය සම්බන්ධයෙන් බලපත්‍ර නිකුත් කරනු ලබන අතර අපනයනය කරනු ලබන සිගරට් ප්‍රමාණය සත්‍ය වශයෙන්ම අපනයනය කර තිබේද යන්න තහවුරු කර ගැනීමට අදාල ක්‍රමවේදයක් දෙපාර්තමේන්තුව විසින් සකස් කර නොතිබුණි.

(iii) බීඩි නිෂ්පාදනයේදී ආනයනය කරනු ලබන බීඩි කොළ වර්ගයේ නිවැරදිතාවය තහවුරු කර ගැනීමට ක්‍රමවේදයක් දෙපාර්තමේන්තුව විසින් මෙතෙක් සකස් කර නොතිබුණි.

## 3.8 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

විෂය අංක 24801 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2016 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව, එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු. 2,858,223 ක් වූ අතර, එම හිඟහිටි ශේෂ වසර 1 සිට වසර 20 ක් දක්වා කාල පරාසයක් ගත වී තිබුණත්, එම හිඟ හිටි ශේෂ අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත්වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට විශ්‍රාම ගිය නිලධාරීන් හය දෙනෙකුගෙන් අය විය යුතු එකතුව රු. 420,993 ක් ඔවුන්ගේ විශ්‍රාම පාරිතෝෂිත මුදල් නිරවුල් කිරීමේදී අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වැඩ තහනමට ලක්වූ නිලධාරීන් 15 දෙනෙකුගෙන් රු. 1,224,830 ක ණය ශේෂයක් අයවීමට තිබුණි. එම ණය ශේෂය තුල වසර 5 ක් සහ වසර 20 ක් ඉක්මවූ පිළිවෙළින් රු. 206,920 ක් සහ රු. 28,700 ක් ඇතුළත් වී තිබුණි.

(ඇ) දෙපාර්තමේන්තුවේ සේවය හැර ගිය නිලධාරීන්ගෙන් 2016 දෙසැම්බර් 31 දිනට රු. 190,160 ක ණය ශේෂයක් අය වීමට තිබුණි. එය වසර 6 සිට වසර 9 දක්වා කාල පරාසයක සිට පැවත එමින් තිබුණද එම ණය ශේෂ නිරවුල් කර ගැනීමට දෙපාර්තමේන්තුව විසින් ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි.

(ඉ) සේවයෙන් පහකල නිලධාරින්ගෙන් අයවිය යුතුව පවතින ණය ශේෂ රු.526,068 ක් වී තිබුණි. එය වසර 7 සිට වසර 20 දක්වා වූ කාලයක සිට හිඟව පවතී.

**3.9 යහ පාලනය හා ගිණුම් කටයුතුභාවය**

**අභ්‍යන්තර විගණනය**

දෙපාර්තමේන්තු අණ පනත්, නිවේදන සහ වෙනත් විධිවිධාන පාදක කරගත් විධිමත් විගණනයක් සිදු කළ බවට ප්‍රමාණවත් සාක්ෂි නොවුණි. ඒ අනුව 2016 අභ්‍යන්තර විගණන සැලැස්මට අනුව ප්‍රමාණවත් කාර්යසාධනයක් සිදු වී ඇති බවක් නිරික්ෂණය නොවිය.

**3.10 වත්කම් කළමනාකරණය**

දෙපාර්තමේන්තුවේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරික්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරික්ෂණය විය.

(අ) රු. 77,690 ක් වටිනා පුස්තකාල පොත් තොගයක් වසර 04 ක් තිස්සේ නිශ්කාර්යව පැවතුණි.

(ආ) අයිතිය වෙනත් ආයතන සතුව පැවති මෝටර් වාහන 02 ක් දෙපාර්තමේන්තුව විසින් භාවිතයට ගෙන තිබුණු අතර එම වාහනවල අයිතිය පවරා ගැනීමට සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඇ) ප්‍රාදේශීය කාර්යාල පවත්වාගෙන යනු ලබන සුරාබදු ස්ථාන 10 කට අදාල ඉඩම් විධිමත්ව පවරා ගැනීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය කාර්යාලවල වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පවත්වා තිබුණද, ප්‍රධාන කාර්යාලයේ භාණ්ඩ සමීක්ෂණයක් සිදුකර නොතිබුණි.

**3.11 අනුකූල නොවීම්**

**නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) 1999 අංක 08 දරන දුම්කොළ බදු පනතේ 17 වන වගන්තිය | දුම්කොළ බදු තෑගි අරමුදලක් ස්ථාපිත කළ යුතු වුවත් එසේ කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) 1998 මාර්තු 04 දිනැති අංක 818 දරන සුරාබදු නිවේදනය | සුරාබදු තෑගි අරමුදලින් සුරාබදු නිළධාරීන්, තොරතුරු සපයන්නන් හා වෙනත් අයට තෑගි මුදල් ගෙවීම සඳහා අනුමත ලිඛිත ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි. |

## 3.12 කාර්යසාධනය

2016 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරී සැලැස්ම අනුව දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

### (අ) අයවැය ඇස්තමේන්තු හා ක්‍රියාකාරී සැලැස්ම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) සුරාබදු ආදායම් සංකේතයට අදාලව රු.මිලියන 125,000 ක ආදායමක් රැස්කිරීමට ඇස්තමේන්තු කර තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසානයට රු.මිලියන 120,238 ක ආදායමක් රැස්කර තිබුණි. එය ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 96 ක් විය.

(ii) දෙපාර්තමේන්තුව තුළ ලියාපදිංචි කර ඇති සැර මත්පැන් නිෂ්පාදන සමාගම් 22 ක් පැවතියද මුළු ආදායමින් සියයට 92 ක දායකත්වය ලබා දී තිබුණේ නිෂ්පාදන සමාගම් 05 කින් පමණි. ඉතිරි නිෂ්පාදන සමාගම් 17 හි ආදායමට දායකත්වය සියයට 7 ක තරම් අඩු මට්ටමක පැවතුණි. මේ අනුව සැර මත්පැන් නිෂ්පාදන සමාගම් 05 ක් මත මෙරට සැර මත්පැන් නිෂ්පාදන වෙළඳපළ රැඳී සිටින බව විගණනයේදී නිරීක්ෂණය විය.

(iii) සැර මත්පැන් නිෂ්පාදනය 2011 වර්ෂයේදී ලීටර් මිලියන 53.8 ක්ව පැවැති අතර එය 2014 වර්ෂය වන විට ලීටර් මිලියන 43.9 ක් දක්වා සියයට 18 කින් අඩු වී තිබුණි.2011 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා අඛණ්ඩව මෙම අඩුවීම වාර්තා වී තිබුණි. එහෙත් 2014 වර්ෂය සමඟ සැසඳීමේදී 2015 වර්ෂයේදී එය නැවත ලීටර් මිලියන 51.8 දක්වා සියයට 18 කින් වැඩිවී තිබුණු අතර 2015 වර්ෂයට සාපේක්ෂව 2016 වර්ෂයේදී එය තවදුරටත් සියයට 7 කින් වැඩිවී තිබුණි. මෙම තොරතුරු අනුව 2011 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා නිෂ්පාදන බදු ගෙවීමට යටත් සැර මත්පැන් ලීටර් ප්‍රමාණය අඛණ්ඩව අඩුවී ඇති බවත් නැවත එය 2015 වර්ෂයේ සිට වැඩිවෙමින් පවතින බවත් නිරීක්ෂණය විය.වර්තමානයෙහි මත්පැන් නිෂ්පාදනය මත ඉතා ඉහළ බදු අනුපාතයන් පනවා තිබුණද, මත්පැන් නිෂ්පාදනයේ මෙම අසාමාන්‍ය විචලනයන් පිළබඳ හේතු විගණනයට ඉදිරිපත් නොවුණි.

(iv) 2011 වර්ෂයේදී රු.මිලියන 47,022 ක් වූ සැර මත්පැන් බදු ආදායම 2016 වර්ෂය වන විට රු.මිලියන 103,496 ක් දක්වා සියයට 120 කින් වැඩිවී තිබුණි. එහෙත් 2011 වර්ෂයේ ලීටර මිලියන 53.8 ක් වූ සැර මත්පැන් නිෂ්පාදනය 2016 වර්ෂය වන විට ලීටර් මිලියන 55.5 ක් දක්වා සියයට 3 කින් පමණක් වැඩිවී තිබුණි.එසේම ලබාගත හැකි වූ තොරතුරු අනුව 2011 වර්ෂයේදී ලීටර් 1 ක නිෂ්පාදන බද්දේ සාමාන්‍යය වූ රු.874 ක මුදල 2016 වර්ෂය වන විට රු.1,865 දක්වා සියයට 113 කින් වැඩිවී

තිබුණි. ඒ අනුව එම කාලය තුළ සුරාබදු ආදායමේ වර්ධනය සඳහා රජය විසින් ඉහළ බදු අනුපාතයක් පැනවීම ප්‍රධාන වශයෙන් හේතු වී ඇති බව නිරීක්ෂණය විය.

(v) සමාලෝචිත වර්ෂයේදී සුරාබදු කාර්මික අපරාධ වැටලීම් 4,593 ක් මඟින් රු.මිලියන 133.51 ක ආදායමක් උපයා ගෙන තිබූ අතර, ඉකුත් වර්ෂයේදී සුරාබදු කාර්මික අපරාධ වැටලීම් 4,932 ක් මඟින් රු.මිලියන 178.51 ක ආදායමක් උපයා තිබුණි. මේ අනුව ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ කාර්මික අපරාධ වැටලීම් ආදායම රු. මිලියන 44.99 කින් හෙවත් සියයට 25 ක අඩු වීමක්ද වැටලීම් ගණන 339 කින් හෙවත් සියයට 7 ක අඩු වීමක්ද නිරීක්ෂණය විය.

(vi) 2015 වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී සිගරට් දඩ ආදායම රු.887,800 කින් හෙවත් සියයට 20 කින් අඩු වී තිබුණි.

**(ආ) සැලසුම් කිරීම**

----------------

2016 ක්‍රියාකාරී සැලැස්ම අනුව කටයුතු නොකළ අවස්ථා පහත පරිදි විය.

(i) සමාලෝචිත වර්ෂයේදී ස්වයංක්‍රීය බදු ගණනය කිරීමේ පද්ධතිය ක්‍රියාවට නැංවීම සඳහා රු. මිලියන18.60 ක ශුද්ධ ප්‍රතිපාදනයක් සිදු කර තිබූ අතර ඉන් වැය කර තිබුණේ සියයට එකක් පමණක් විය. පද්ධතිය ආරම්භ කිරීමට ප්‍රථම එහි අවශ්‍යතා හඳුනා ගෙන සැලසුම් නොකිරීම හේතුවෙන් වැඩ කටයුතු ප්‍රමාදවීම මේ සඳහා හේතු වී තිබුණි.

(ii) සුරාබදු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය (රාජගිරිය) ඉදිකිරීම සඳහා 2015 හා 2016 වර්ෂවල එකතුව රු. මිලියන 500.00 ක ප්‍රතිපාදන සලසා තිබුණත් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් ඉදිකිරීම් නිම වී නොතිබුණි.

(iii) සමාලෝචිත වර්ෂයේ කාර්යමණ්ඩල පුහුණුව සඳහා රු. මිලියන 15.00 ක ශුද්ධ ප්‍රතිපාදනයක් සලසා තිබුණි. ඉන් අපේක්ෂිත ආකාරයෙන් කාර්යමණ්ඩලය පුහුණු කටයුතු සිදු නොකිරීම හේතුවෙන් රු. මිලියන 2.47 ක් හෙවත් සියයට 16 ක් ඉතිරිවී තිබුණි.

**(ඇ) ප්‍රමාණවත් ලෙස ඉටුනොකළ ප්‍රධාන කාර්යයන්**

---------------------------------------------------

දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් ප්‍රමාණවත් ලෙස ඉටු නොකර තිබුණු අතර, එසේ නිරීක්ෂණය වූ අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(i) රා රේන්ද බලපත්‍රලාභීන් විසින් නියමිත කලට අදාල රා රේන්ද බලපත්‍ර ගාස්තු ගෙවන බවට තහවුරුවක් ලබා ගැනීමට සුදුසු ක්‍රමවේදයක් දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ii) 1994 මාර්තු 04 දිනැති අංක 818 දරන සුරාබදු නිවේදනයේ 4.5 වගන්තිය ප්‍රකාරව නිර්භීත ක්‍රියා හෝ විශේෂ පිළිගැනීම් කටයුතු වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.200,000 ක් වෙන් කර තිබුණි. 1994 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා එවැනි ක්‍රියා සඳහා දෙපාර්තමේන්තුව විසින් ගෙවීම් කර නොතිබුණි.

(iii) නිලධාරීන්ගේ පුහුණුව හා අධ්‍යයන කටයුතු වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී සුරාබදු ත්‍යාග අරමුදලෙන් රු.4,500,000 ක් වෙන්කර තිබුණි. පුහුණුව ලැබූ නවක නිලධාරීන්ට ආහාර සැපයීම වෙනුවෙන් පමණක් ඉන් රු.2,331,515 ක් හෙවත් සියයට 52 ක් වැයකර තිබුණි. එසේම ඉතිරිය වූ රු.2,168,500 ක මුදල කිසිදු පුහුණු කටයුත්තක් සඳහා වැය කර නොතිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුවේ නිළධාරීන්ගේ පුහුණු හා අධ්‍යාපනික කටයුතු සඳහා විධිමත් සැලැස්මක් සකස් කර නොතිබුණි.

(iv) 2009 සුරාබදු ආඥාපනතේ 13 වැනි වගන්තියේ සඳහන් ප්‍රතිපාදනවලට අනුකූලව ස්ප්‍රීතු අපනයන හෝ ආනයනය කරනු ලබන අවස්ථාවකදී හෝ ස්කාගාරයකින් හෝ ගුදමකින් ස්ප්‍රීතු ප්‍රවාහනය කරනු ලබන අවස්ථාවකදී ඒ සඳහා සුරාබදු අවසර පත්‍රයක් ලබා ගත යුතු වේ. (D28 අවසර පත්‍රය) එම ප්‍රවාහන බලපත්‍රයේ පිටපතක් නිෂ්පාදනාගාරයේ පිහිටි සුරාබදු කාර්යාලයේද තිබිය යුතු විය. එහෙත් එවැනි ප්‍රවාහන බලපත්‍ර ලබා නොගත් අවස්ථා පැවති බව නියැදි විගණන පරීක්ෂාවලදී නිරීක්ෂණය විය. ඒ අනුව නිෂ්පාදනාගාරයට ලැබුණු තොග පිළිබඳව නිවැරදි අධීක්ෂණයක් සිදුවන බවට විගණනයේදී සෑහීමකට පත්විය නොහැකි විය.

## 3.13 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

-------------------------------

දෙපාර්තමේන්තුව විසින් සිදුකර තිබුණු සමහර ගනුදෙනු මතභේදාත්මක ස්වරූපයේ ඒවා විය. නියැදි පරීක්ෂණවලදී අනාවරණය වූ එවැනි ගනුදෙනු කිහිපයක් පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) අංක 1544/17 දරන 2008 අප්‍රේල් 10 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ 27 වන කොන්දේසිය අනුව මත්පැන් විකිණීම සඳහා බලපත්‍රලත් පරිශ්‍රයක පිහිටීම, වෙනස් කිරීමට ඉඩ නොදිය යුතුබව දැක්වෙතත් මාතලේ නගරයේ රට බීම හලක් පවත්වාගෙන යාම සඳහා 1996 වසරේ ලබා දී තිබූ බලපත්‍රයක් මත එම රට බීම හල මඩකළපුව දිස්ත්‍රික්කයේ තුනුක්කායි නගරයේ පවත්වාගෙන යාම සඳහා 2010 වසරේ දී අනුමැතිය ලබා දී තිබුණි. තවද මෙම රට බීම හල සඳහා හිඟ බලපත්‍ර ගාස්තුද අයකර නොතිබුණි.

(ආ) පෞද්ගලික සමාගමක් විසින් ධාන්‍ය භාවිතා කරමින් එතිල් මධ්‍යසාරය නිෂ්පාදනය (Grain Based Distillery) කිරීම සඳහා ව්‍යාපෘති යෝජනාවක් සහ පූර්ව ශක්‍යතා වාර්තාවක් දෙපාර්තමේන්තුව වෙත 2015 මාර්තු 23 දින ඉදිරිපත් කර තිබුණි. ඒ සඳහා මුදල් අමාත්‍යාංශයේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් විසින් නියමු ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා අනුමැතිය ලබා දී තිබුණි. ව්‍යපෘති වාර්තාවට අනුව එය ආරම්භ කළ යුතුව පැවතියේ කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ වුවත් ඊට පටහැනිව නිෂ්පාදනාගාරය කල්කුඩා ප්‍රදේශයේ (මඩකලපුව) ආරම්භ කර තිබුණි. එසේම කර්මාන්තය සඳහා යොදාගනු ලබන ධාන්‍ය වර්ග මොනවාද යන්න පිළිබඳ තොරතුරු ව්‍යාපෘති වාර්තාව තුළ නිශ්චිතව දක්වා නොතිබුණි. තවද අමුද්‍රව්‍යවල යෙදවුම් නිමවුම් අනුපාතය පිළිබඳ තොරතුරු ද ඉදිරිපත් කර නොතිබුණි. ධාන්‍ය වර්ගයන් අමුද්‍රව්‍ය ලෙස යෙදවීමේදී එතිල් නිෂ්පාදනය ජනනය වීම පිළිබඳ කාර්මික වාර්තාවක්ද ඉදිරිපත් කර නොතිබුණි. යෝජිත සලාංගය පිළිබඳව සම්පූර්ණ වාර්තාවක් හා නිහඬ ස්ප්‍රීතු (ENA) හා RS පරිපාත ස්ප්‍රීතු (RS) වල භාවිතා කරන නිර්ණායක පිළිබඳ වාර්තාවක් ද ඉදිරිපත් කර නොතිබුණි. ව්‍යපෘති වාර්තාව සමග පලාත් පාලන ආයතන අනුමැතිය, පාරිසරික වාර්තා, ඉඩමේ අයිතිය පිළිබඳ වාර්තා, බොයිලේරු සහතික වැනි ලිපිලේඛනද ඉදිරිපත් කර නොතිබුණි. එසේ තිබියදී ව්‍යාපෘතිය සඳහා අනුමැතිය ලබා දී තිබීම මතභේදයට තුඩුදෙන කරුණක් විය.

(ඇ) බොරලැස්ගමුව ප්‍රදේශයේ පෞද්ගලික ආයතනයක් විසින් ර.බී 08 යන සුරාබදු බලපත්‍රයක් ඉල්ලුම් කර තිබුණද විවිධ කරුණු හේතුවෙන් එම බලපත්‍රය ලබාදිය නොහැකි බව සුරාබදු දෙපාර්තමේන්තුව තීරණය කර තිබුණි. එහෙත් 2016 ඔක්තෝබර් 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අදාල බලපත්‍රය පසුව නිකුත් කර තිබීම විගණනයේදී මතභේදයට තුඩු දෙන කරුණක් විය.

(ඈ) ජනාධිපති ලේකම්වරයාගේ අංක CSA/4/5/38 හා 2016 ජුනි 06 දිනැති ලිපිය අනුව සුරාබදු බලපත්‍ර නිකුත් කිරීමේදී ජනාධිපති ලේකම්වරයාගේ පූර්ව අනුමැතිය ලබා ගත යුතු වේ. එසේ අනුමැතිය ලබා ගැනීමකින් තොරව ර.බී 07 හා ර.බී 08 යන වර්ග වලින් බලපත්‍ර 11ක් ලබා දී

ඇති බව නියැදි විගණන පරීක්ෂණ වලදී නිරීක්ෂණය විය.

(ඉ) පූජණීය ස්ථාන සඳහා තිබිය යුතු නියමිත දුර ප්‍රමාණය සපුරා නොමැති බව අම්බලන්ගොඩ ප්‍රාදේශීය මහ ලේකම් විසින් වාර්තා කර තිබියදී එම කරුණු නොසලකා පෞද්ගලික මිනින්දෝරු වාර්තාවක පිටපතක් පදනම් කරගෙන හෝටලයක් සඳහා ර.බි 11 බලපත්‍රයක් ලබා දී තිබුණි.

(ඊ) නියැදි පරීක්ෂණයට ලක් වූ මත්පැන් අලෙවිසැල් 02 ක අලෙවිය සඳහා වූ මත්පැන් නියමිත සැර ප්‍රමාණයන්ට අනුකුල නොවීය. ඒ අනුව නියම කර ඇති සැර ප්‍රමාණයන්ගේ පිරිවිතරයන්ට අනුව නිෂ්පාදනය සිදුකර ඇති බවට තහවුරුවක් ලබාගත හැකි වන පරිදි සුරාබදු නිලධාරීන්ගේ අධීක්ෂණයක් සිදු වී ඇති බවක් නිරීක්ෂණය නොවීය.

## 3.14 පාඩු හා හානි

--------------

දෙපාර්තමේන්තුව සතු වාහනයක් 2007 අගෝස්තු 08 දින අනතුරට ලක්වීමෙන් රු. 600,465 ක අලාභයක් සිදුවී තිබුණි. එම අනතුරට වගකිව යුතු රියදුරාගෙන් අලාභය අය කර ගැනීමට නීතිමය ක්‍රියා මාර්ග ගෙන තිබූ නමුත් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අලාභය අයකර ගැනීමට නොහැකි වී තිබුණි.

## 3.15 කළමනාකරණ දුර්වලතා

--------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) දෙපාර්තමේන්තුවේ කාර්යාල පවත්වාගෙන යාමට අවශ්‍ය ගොඩනැගිලි ඉදිකිරීම් කටයුතු තව දුරටත් ප්‍රමාද වීම හේතුවෙන් කුලී ගොඩනැගිලිවල කාර්යාල පවත්වාගෙන යාම වෙනුවෙන් රු.12,870,756 ක මුදලක් සමාලෝචිත වර්ෂයේදී වැය කර තිබුණි.

(ආ) 2002 අප්‍රේල් 18 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ 4 වැනි පරිච්ඡේදය මගින් විපරිත (ස්වභාවය වෙනස් කළ) ස්ප්‍රීතු පාලනය වන රීති යටතේ මධ්‍යසාර සක්‍රිය හා නිත්‍ය ලෙස මිනිස් පරිභෝජනයට නුසුදුසු බවට පත්කිරීම සඳහා බ්‍රිටෙක්ස් වැනි විපරිකාරකයක් යොදා විපරිකරණය කළ යුතු බව දක්වා තිබුණි.එහෙත් පෞද්ගලික සමාගමක් විසින් 2016 මාර්තු මාසය දක්වා කාර්මික කටයුතුවලට ලබා ගත් ස්ප්‍රීතු සඳහා විපරිකරණය කිරීම සඳහා බ්‍රිටෙක්ස් නැමැති විපරිකාරකය යොදා නොමැති බවට තහවුරු වී තිබුණි. 2016 මාර්තු 01 දින බ්‍රිටෙක්ස් නැමැති විපරිකාරකයෙන් ග්‍රෑම් 500 ක් අදාල නිෂ්පාදන ආයතනය විසින් ලබාගෙන තිබුණද 2014 හා 2015 යන වර්ෂවලදී එම ආයතනය වෙත සුරාබදු දෙපාර්තමේන්තුව විසින් ඉහත විපරිකාරකයන් නිකුත් කළ බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. නිෂ්පාදන කටයුතු සඳහා ලබා ගත් ස්ප්‍රීතු තොග විපරිකරණය කිරීමට කටයුතු කිරීම පිළිබඳ විධිමත් තහවුරුවක්ද ලබාගෙන නොතිබුණි.

(ඇ) 2016 මාර්තු 02 දිනැති අංක 988 දරන සුරාබදු නිවේදනයට අනුව ආනයනික ස්ප්‍රීතු මත සුරාබද්දක් අයකරනු ලබයි. එහෙත් 2015 සහ 2016 වර්ෂවලදී බදු ගෙවන ලද ස්ප්‍රීතු ප්‍රමාණයට වඩා වැඩිපුර පිළිවෙලින් ස්ප්‍රීතු ලීටර් 10,604.6 ක් සහ ලීටර් 6,455.7 ක ප්‍රමාණයක් මෙරටට ගෙන්වා ඇති බව විගණනයේදී නිරීක්ෂණය විය. මෙසේ වැඩිපුර ගෙන්වන ලද ස්ප්‍රීතු ප්‍රමාණයට අදාළව සුරාබදු අය කළ බවට තොරතුරු විගණනයට ඉදිරිපත් නොවූ අතර මෙරටට ගෙන්වන ලද ස්ප්‍රීතු ප්‍රමාණය දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ අධීක්ෂණයට ලක් වූ බවටද සාක්ෂි ඉදිරිපත් නොවීය. තවද ස්ප්‍රීතු ලැබීම් සහ ස්ප්‍රීතු තොග පිළිබඳ සටහන් සහ වාර්තා විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) සුරා කර්මාන්ත අත්පොතෙහි 2 වැනි පරිච්ඡේදයේ සඳහන් කරුණු අනුව සුරාබදු අධිකාරීවරයා තමාගේ බල ප්‍රදේශයට අයත් ගුදම්වල පොත්පත් පරීක්ෂා කිරීම හා තොග පොත්වල ශේෂයන් හා අනිකුත් ශේෂයන් සමඟ සසඳා හරි වැරදි බැලීම මාසිකව සිදු කළ යුතු වේ. එහෙත් 2016 වර්ෂයේදී කළුතර දිස්ත්‍රික්කයේ නිෂ්පාදනාගාර අධීක්ෂණ කටයුතු සඳහා අදාල සුරාබදු අධිකාරීවරයා සහභාගීවී නොතිබුණු බව පරීක්ෂණ සටහන් පොත අනුව නිරීක්ෂණය විය.

## 3.16 කොන්ත්‍රාත් පරිපාලනය

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සුරාබදු දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි ඉදිකිරීමේ උපදේශක ලෙස ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් කටයුතු කරනු ලැබේ. එහෙත් විධිමත් ලෙස කොන්ත්‍රාත්කරුවන් තෝරා ගැනීමටද පෙර මූලික ඇස්තමේන්තුව පදනම් කරගෙන දෙපාර්තමේන්තුව විසින් ගොඩනැගිලි ඉදිකිරීමේ කටයුතු සඳහා ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට ප්‍රතිපාදන මුදාහැර තිබුණි. මේ අනුව ඉදිකිරීම් සඳහා දෙපාර්තමේන්තුවට ලැබී තිබුණු ප්‍රතිපාදන වෙනත් පාර්ශවයන් අවිධිමත් ලෙස පරිහරණය කරන බව විගණනයේදී නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයේදී සහ ඉකුත් වර්ෂයේදී එසේ මුදාහරින ලද මුදල පිළිවෙලින් රු.41,000,000 ක් සහ රු.50,000,000 ක් වී තිබුණි.

(ආ) මහනුවර හා නුවරඑළිය සුරාබදු කාර්යාල ඉදිකිරීම් සඳහා ඇස්තමේන්තුගත සම්පූර්ණ ප්‍රතිපාදනය වන එකතුව රු. මිලියන 61.84 ක් 2016 ජූනි 15 දින වන විට ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත නිදහස් කර තිබුණි. එසේ වුවත් 2017 මැයි මස වන විටත් ඉදිකිරීම් කටයුතු නිම කර නොතිබුණි.

(ඇ) දෙපාර්තමේන්තුව සඳහා ගොඩනැගිලි 05 ක් ඉදිකිරීම වෙනුවෙන් 2013 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා එකතුව රු. මිලියන 377.05 ක මුදලක් වැයකර තිබුණද 2016 දෙසැම්බර් 31 දිනට කිසිදු ගොඩනැගිල්ලක ඉදිකිරීම් කටයුතු අවසන්ව නොතිබුණි. 2017 ජූලි 31 දින වන විට ගොඩනැගිලි දෙකක පමණක් ඉදිකිරීම් කටයුතු අවසන්ව තිබුණි.

## 3.17 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2016 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| (i) ජ්‍යෙෂ්ඨ මට්ටම | 64 | 40 | 24 |
| (ii) තෘතියික මට්ටම | 433 | 379 | 54 |
| (iii) ද්විතියික මට්ටම | 818 | 662 | 156 |
| (iv) ප්‍රාථමික මට්ටම | 172 | 166 | 06 |
| **එකතුව** | **1487** | **1247** | **240** |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) දෙපාර්තමේන්තුවේ මෙහෙවරට සෘජුවම දායකත්වයක් සපයනු ලබන ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු වන නියෝජ්‍ය සුරාබදු කොමසාරිස් තනතුරු 04 ක්ද සහකාර සුරාබදු කොමසාරිස් තනතුරු 03 ක්ද වශයෙන් තනතුරු 07 ක් පුරප්පාඩුව පැවතුණි. තවද සුරාබදු අධිකාරී, ප්‍රධාන සුරාබදු පරීක්ෂක සහ සුරාබදු පරීක්ෂක යන තනතුරුවල පැවැති පිළිවෙලින් 13 ක්, 13 ක්, හා 27 ක පුරප්පාඩු පිරවීම සඳහා ද සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) සංවිධාන ව්‍යුහය තුළ වැඩ බෙදීම, රාජකාරී වැඩ විෂයන් කාලීනව මාරු කිරීම මඟින් කාර්යක්ෂම සේවයක් ලබා ගැනීම සහ අභ්‍යන්තර පාලනය ශක්තිමත් කිරීම යන කරුණු සැලකිල්ලට ගෙන මානව සම්පත් කළමනාකරණය සිදුකර ඇති බවක් නිරීක්ෂණය නොවීය.